ආනන්ද පද්මසිරි



සුබ අලුත් අවුරුද්දක් වේවායි මුලින්ම නව වසරට සුබ පැතුතම් ගෙන එමු.

2018 දීවත් කලා ක්ෂෙත්‍රයේ නියුතු නිර්මාණකරුවන්ට සාධාරණය ඉටුවේවායි ඊළගට පතන්නෙමු. එසේ කරන්නේ 2017 දී ද ඔවුනට බොහෝ අසාධාරණ අකටයුත-කම් සිදුවූ නිසා ය. ඉන් බොහෙමයක් සිදුවූයේ (සිදුකෙරුණේ) මාධ්‍ය වලිනි. නිෂ්පාදකවරුන්ගෙනි.

සංගීත ක්ෂෙත්‍රය තුළදී නිර්මාණකරුවන්ට සිදුවන

# 2018 දී වත්



අසාධාරණයන්ට 2017 දීවත් වැට බැඳුණේ නැත. තැටි නිෂ්පාදකයන් හා අතරමැදියන් නිර්මාණකරුවන්ගේ අයිතිය කොල්ල කමින් දුරකතන සමාගම් හා එක්ව කරන රිගින්ටෝන් ජාවාරම ප්‍රබලම අසාධාරණය වේ. කැසට් යුගයේ කැසට් සඳහාද සංයුක්ත තැටි යුගයේ ඒවා සඳහාද ගී ගැයූ ලියූ සංගීතවත් කළ ශිල්පීන්ගේ කිසිදු අවසරයකින් තොරව දුරකතන රිගින්ටෝන් සඳහා නිෂ්පාදකයන් හා අතරමැදියන් ඒවා විකිණීම වහා නැවැත්විය යුත්තකි. මේ සම්බන්ධයෙන් කීප-දෙනෙකු දැනටද නීතිය හමුවට ගොස් ඇත.

එමෙන්ම අමු අමුවේ කිසිදු හිරිකිතයකින් තොරව අනුන්ගේ ගීත ගයමින් මුදල් ඉපයීමද සමහර ගායක ගායිකාවන් පුරුද්දක් කරගෙන තිබේ. ගායක ගායිකා සංගමයේ සභාපති කීර්ති පැස්කුවල් රියැලිටි තරග වල විනිසුරෙකු ලෙස නවකයන්ට පවසන්නේ "ඒ ගීතය ඔබේ කරගෙන ගයන්න" කියා ය. එය දේව වාක්‍යයක් සේ අදහා තරගයෙන් ඔබ්බට ගොනගොස් ඔවුහු ඒවා තමන්ගේම කරගනිති. මෑතදී ගාලුමුවදොර සංගීත ප්‍රසංගයකදී සුපිරි තරු ගායිකාවක් ගීත තුනක් ගැයුවාය. ඒ ගීත තුනම ලතා වල්පොල සහ ඇන්ජලින් ගුණතිලකගේ ගීතයි.

එපමණක් නොව නලු නිළියන් බොහොමයක් ගෙන්වා විදේශවල සංගීත ප්‍රසංග පවත්වන විටද ඔවුන් ගයන්නේ අනුන්ගේ ගීතයි. ඒ කිසිදු අවස්ථාවක මුල් නිර්මාණකරුවන්ට ප්‍රතිලාභයක් හිමිනොවේ. ඇතැම්විට මුල් නිර්මාණකරුවන් දැඩි ආර්ථික අගාධවල ගිලී සිටියදී හෝ රෝගීව සිටියදීත් ඔවුන්ගේ නිර්මාණ තුළින් වෙනතම පිරිසක් උපරිම ආදායම් ඉපයීම දෛවයේ සරදමකැයි සිතා නිහඬවිය නොහැකිය. බුද්ධිමය දේපළ පනත නමට පමණක් තබා නොගෙන නිර්මාණකරුවන්ට සාදාරණය ඉටු කරන්නට බලධාරීන් ක්‍රියා කළ යුතුය. නීති මාර්ගයට පිවිසෙන අයටද කළකිරීම් ඇතිවන්නේ නීතිමය පියවර ඉතා ප්‍රමාදවීම නිසා ය. එබැවින් ඒ ගැනද අවධානය යොමු විය යුතු ය.

සංගීත ක්ෂෙත්‍රයේ එවැනි ප්‍රධාන ගැටලු පමණක් නොව සිනමාව හා රූපවාහිණියේ ගැටලු රැසකි. චිත්‍රපට හැදූ බොහෝ දෙනෙක් ඒවා තිරගත කරගන්නට නොහැකිව තැවෙමින් සිටිති. ටෙලිනාට්‍ය පෝලිමද එසේම ය. රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය වල නියමුවන් ගැටලු අවම කරගන්නට උත්සාහ දරද්දී භූතයෝ කකුලෙන් අදිති. හරි දේ හරි විදිහට කරන්නට නොදෙති.

මෙකී නොකී සියලු දෙයින් පීඩනයට පත්වන්නේ සිය නිර්මාණ වලින් සමාජය තෘප්තිමත් කරන නිර්මාණකරුවන් ය. 2018 දීවත් එම නිර්මාණකරුවන්ට සාධාරණය ඉටුවී යහපත උදාවේවා.

Alpha Academy 2017
Glen Waverley Classes

Grade 8 , 9 - Mathematics
Grade 8 , 9 - Science
Grade 8 ,9 - English
VCE Chemistry 1 , 2
VCE Biology 1 , 2
Other subjects - Upon request

- All students will be tested before enrolment , placed accordingly in the groups
- Unit Tests for all subjects
- VCE , SAC preparation guidance
- Ongoing updates for parents
- Multiple classes during week , enabling catch-up classes

To request an application,
please text student name, Class and school to
0457908918

39 වන පිටෙන්

නමුත් සිව්පද කවියක මුල් පාදය ලඝුවකින් පටන් ගෙන අනෙක් පාද එකක් හෝ දෙකක් හෝ තුනම ගුරුකින් පටන් ගත්තාට එය මුල් ගුරු බිඳීමේ දෝෂයට හසු නොවේ. උදාහරණයක් ලෙස 'ඇවිළිණි කුමරි බඹසර' පොතෙහි එන පහත සඳහන් කවිය සලකන්න.

නිසොල්මනේ උන් වෙත පා සෙනෙහෙ දයා
මෙත් සිතිනේ වැඩ සිටියා දෙනෙත පියා
පව් පිරුණේ නැති වැදි දන තුටින් ගයා
වැඳ වැටුණේ රැඳි දුනු හී පසෙක තියා

එසේම සිව්පද කවියක පාද හතරම ගුරු අක්ෂරවලින් පටන් ගත හොත් එය මුල් ගුරු බිඳීමේ දෝෂයට හසු නොවේ. ඒ අනුව පහත සඳහන් කවිය මෙම දෝෂයෙන් වියුක්තය.

ඊයෙත් මම හැන්දෑවේ පුංචි කළේ උකුලෙ තියා
ආච්චීට හොර රහසෙන් වෙල් එළියේ ළිඳට ගියා
රූ මාමගෙ සුරංගනා කතාවකුත් ඇත්ත කියා
බෝදිලිමා කඩුල්ල ළඟ බලන් ඉඳල පැනල ගියා

කෙසේ වෙතත් මුල් ගුරු බිඳීමක් සිදුවූයේ පදගත අර්ථය රැකීම සඳහා හෝ කවියේ අර්ථය රැකීම සඳහා නම් එය දෝෂයක් කොට නොසැලකිය යුතුය.

## අග පෙළ සිඳීමේ දෝෂය

අන්තර්ජාලයෙන් හමුවුණ පහත දැක්වෙන කවිය සලකා බලමු.

රට සංකරයි එහි ගත යුත්තක් නැත්තේ
උතුරෙත් දකුණෙ අරගල ඉවරයක් නැතේ
ඉන්නා අයත් ලොක්කන් පදයට වැනෙතේ
ගෙවු තිස් වසරෙ මෙහි කිසි දියුණුවක් නැතේ

මෙහි මාත්‍රා ප්‍රස්ථාරය පහත දැක්වෙන පරිදිය.

- -   ◡ - - -   - -   - -   ◡ ◡   ◡ ◡
- - ◡   - - -   - - - -   - - - ◡   - ◡
◡ ◡   - ◡   ◡ ◡   - - - -   - - ◡
- -   ◡   - - -   - -   - -   - - - ◡   - ◡

මෙම ප්‍රස්ථාරයට අනුව ඉහත කවියේ එළිසම කොටසේ ගුරු/ලඝු පිහිටීම පාද හතරේ විෂමාකාරය. එනිසා මෙම කවිය අග පෙළ සිඳීමේ දෝෂයට හසුවූ බව පෙන්වයි. නමුත් මෙම කවිය අර්ථය වෙනස් නොවන අන්දමින් පහත දැක්වෙන අයුරින් වෙනස් කළ විට තත්වය සලකා බලමු.

රට සංකරයි එහි ගත යුත්තක් නොමැතේ
උතුරෙත් දකුණෙ අරගල තවමත් පැවතේ
ඉන්නා අයත් ලොක්කන් පදයට වැනෙතේ
ගෙවු තිස් වසරෙ මෙහි දියුණක් ගැන නොසිතේ

- -   ◡ - - -   - -   - -   ◡ ◡   - - ◡
- - ◡   - - -   - - - -   - -   ◡   - - ◡
◡ ◡   - ◡   ◡ ◡   - - - -   - - ◡
- -   ◡   - - -   - -   - - ◡   ◡   - - ◡

මෙම මාත්‍රා ප්‍රස්ථාරයට අනුව ඉහත කවියේ එළිසම කොටසේ ගුරු/ලඝු පිහිටීම පාද හතරටම සමාකාර බව පෙනේ. ඒ අනුව මෙම කවිය අග පෙළ සිඳීමේ දෝෂයෙන් වියුක්ත වේ.
ඉපැරැණි සම්භාව්‍ය සඳැස් කවියන් මෙම දෝෂ පිළිබඳව මනා ලෙස සැලකිලිමත් වී ඇති බව ලෝවැඩ සඟරාව, සුභාෂිතය, තිසර සංදේශය, සැළලිහිණි සංදේශය, ගුත්තිලය වැනි කාව්‍ය ග්‍රන්ථ පරිශීලනය කිරීමෙන් දත හැක. නමුත් මෙහි සඳහන් කළ දෝෂ අතරින් 'මුල් ගුර බිඳීමේ දෝෂය' සහ 'අග පෙළ සිඳීමේ දෝෂය' ගැන කොළඹ යුගයේ සමහරක් ප්‍රවීණ කවියන්ද ඇතුළුව බොහෝ වර්ථමාන කවි කිවිඳියන් දක්වා තිබෙන්නේ අඩු අවධානයක් බව පෙනී යන කරුණකි. කෙසේ වෙතත් මෙම දෝෂ මගහැර කවි පබැඳීම හෙළ සඳැස් කවියේ උන්නතිය සඳහා වන සාධනීය කර්තව්‍යයක් වන්නේය.